# පරිකල්පනය මෙහෙයවා නිර්මාණකරණයේ යෙදෙමු.

අලුතින් යමක් සිතීම, අලුත් යමක් නිර්මාණය කිරීම පරිකල්පනය නම් වේ. නාට්‍ය ශිල්පියෙකුට පරිකල්පනය අත්‍යවශ්‍ය වේ. එබැවින් පරිකල්පන අභ්‍යාස වල නිරත වීම වැදගත් වේ. පිටපතක් රචනා කිරීමට, අනුශාංගික අංග මෙහෙයවීමට හොඳින් රංගනයේ යෙදීමට පරිකල්පනය වැදගත් වේ.

තම නිර්මාණ වලින් අලුත් යමක් කිරීමට පරිකල්පනය අත්‍යවශ්‍ය වේ. තම පරිකල්පනය මෙහෙයවා අපූර්ව නිර්මාණ කළ ලොව සාර්ථක පිරිස් බොහෝ ඇත. එදිනෙදා ජීවිතයේදී තම වැඩ කටයුතු සඳහා ද පරිකල්පනය යොදා ගත හැක.

ඔබට ඔබගේ වයස් ප්‍රමාණ අනුව යම් පරිකල්පන ශක්තියක් ඇත.මෙහි දී ඔබ ඔබේ පරිකල්පන මට්ටමෙන් නිර්මාණ කාර්යයෙහි යෙදිය යුතුය. පළමුව මනසින් සූදානම් විය යුතුය. විශ්ව කීර්තියට පත් නිර්මාණකරුවන් තම නිර්මාණ බිහිකළේ සිය පරිකල්පන ශක්තිය මෙහෙයවීමෙන්ය. මෙහි දී වෙනත් අයෙකුගේ කිර්මාණයන් අනුකරණය නොකර ස්වතන්ත්‍ර හැකියාව මතුකරගත හැකිය. ස්වකීය පරිකල්පන හැකියාව යෙදවීමෙන් නව නිර්මාණ බිහිවේ.





මනසින් ලොව දකිමු - නව නිමැවුම් බිහිකරමු. යන ආදර්ශ පාඨය ද මේ සඳහා පූර්වාදර්ශයකි.

ඒ ආකාරයට පරිකල්පනය මෙහෙයවා අප නිර්මාණකරණයේ යෙදෙමු.

පැවරුම් : විවිධ වර්ණ කඩදාසි උපයෝගී කරගෙන නිර්මාණ සාදන්න.

ඉවත දමන ද්‍රව්‍ය මගින් නිර්මාණ හදන්න.